# පුස්තකාලය භාවිතයේදී විශ්වවිද්‍යාල සිසුන් මුහුණපාන ගැටලු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්
## (කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරිනි)

එච්. එම්. යූ. පී. හේරත්[1]

**සංක්ෂේපය**

විශ්වවිද්‍යාලයේ හදවත ලෙස සැලකෙන පුස්තකාලය සඳහා විශ්වවිද්‍යාල පරමාර්ථ ඉටුකරගැනීම සඳහා සිදු කළ හැකි කාර්ය සමුදායක් වේ. උසස් ශ්‍රම හා බුද්ධි බලකායක් නිර්මාණය කිරීමට අවශ්‍ය වන දැනුමක් එක්රැස් කිරීම ද, සංවිධානය කිරීමද, තැම්පත් කර ආරක්ෂා කරගැනීමද, අවශ්‍ය අවස්ථාවන්හිදී එම දැනුම ප්‍රයෝජනයට ගැනීමට පහසුකම් සැලසීම ද විශ්වවිද්‍යාල පුස්තකාලයේ ඉටුවිය යුතු වැදගත් කාර්යන් වේ. ඒ අනුව, කාර්යක්ෂම හා ඵලදායි පුස්තකාල සේවාවක් සැපයීම සඳහා පාඨකයින් පුස්තකාල භාවිතයේදී මුහුණපාන ගැටලු හඳුනාගත යුතු ය. එසේ හඳුනා ගැනීමෙන් පුස්තකාල සේවා වැඩිදියුණු කිරීමටත් පවත්නා දුර්වලතා මඟහරවා ගැනීමටත් විකල්ප සේවාවන් හඳුන්වා දීමටත් හැකියාව ලැබෙනු ඇත. මෙම අධ්‍යයනය කැලණිය විශ්වවිද්‍යාලය මූලික කරගනිමින් කරන ලදී. පුස්තකාලය විසින් පවත්වාගෙන යනු ලබන සේවා හඳුනාගැනීම සහ ඇගයීම, ශිෂ්‍යයන් අධ්‍යයන පුස්තකාලය භාවිතයේදී මුහුණපාන ගැටලු හඳුනාගැනීම සහ පුස්තකාල වැඩිදියුණු කිරීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග හඳුනාගැනීම අධ්‍යයනයේ අරමුණ විය. දත්ත එක්රැස් කරගැනීම සඳහා ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා, පුස්තකාලය නිරීක්ෂණය කිරීම ආදිය භාවිත කළ අතර නියැදිය සඳහා දෙවන වසර සිසුන් සියලුම පීඨ නියෝජනය වන පරිදි අහඹු ලෙස 100 ගෙන් යුතු නියැදියක් තෝරාගන්නා ලදී. මෙමගින් පාඨක අධ්‍යාපන, පුස්තතකාල එකතුව වර්ධනය කිරීම, පුස්තකාල ප්‍රකාශන හා නව තොරතුරු තාක්ෂණය භාවිතයට ගැනීම, ඡායා පිටපත් සේවය වැනි පුස්තකාල සඳහා ලබා දෙන යටිතල පහසුකම් වැඩිදියුණු කළයුතු බවට තව තවදුරටත් අධ්‍යයනය මඟින් අවධාරණය විය. පුස්තකාල භාවිතයේදී, ශිෂ්‍යයින් මුහුණපාන ගැටලු සැලකිල්ලට ගැනීමේදී සම්පත් හිඟකම, සම්පත් පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ඇති පුස්තකාල නිලධාරින් හිඟකම, සම්පත් පිළිබඳ සිසුන් තුළ අවබෝධයක් නොමැතිකම පෙන්වා දී ඇත. පුහුණු ශ්‍රමිකයින් ප්‍රමාණවත් නොවීම, පුස්තකාල සම්පත් ලබාගැනීමේ අපහසුව හා කාර්යමණ්ඩලයේ තාක්ෂණික දැනුම අඩුකම පුස්තකාල නිලධාරින් හමුවේ ඇති ගැටලුවේ. පවත්නා මූලාශ්‍ර මඟින් තොරතුරු ලබාගැනීම හා ශිෂ්‍යයින්ගේ අධ්‍යාපන වැඩසටහන් වලට නවීන සේවා හඳුන්වා දෙමින් පාඨක අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම, පුහුණු වැඩසටහන්, සුචි සම්පාදනය, අන්තර් පුස්තකාල පිරැළු සේවා මෙන්ම පුස්තකාල සහයෝගීතාවය මත සම්පත් හුවමාරු කරගැනීම ආදිය අධ්‍යයනය මගින් යෝජිත සේවා කිහිපයකි.

**මුඛ්‍ය පද** : අධ්‍යයන පුස්තකාල, විශ්වවිද්‍යාල සිසුන්, පුස්තකාල සේවා

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, udithapriyankara9525@gmail.com